# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1943/7 - 2015 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2015.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: KHDS/LND/04/ACQ/13.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය.*: 4/3/15/2011/*වීථි/128.*

ගම් පුළුල් කිරීම යටතේ බෙදා දීම සඳහා (මහජන කටයුත්තක්) සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නිල්පත්තුව සුළු කොට්ඨාසයේ, වැල්ලදූර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 12, අතිරේක අංක 25, පත්‍ර 23 සහ 2014.08.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 843 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.6700 ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 843**

ඉඩමේ නම: වැල්ලදූරවත්ත ක්ෂේත්‍ර අංක 06; විස්තරය: ගෙවතු සහ වතු, අවු. 5 - 10 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවන්, ස්ථිර ගොඩනැගිලි 10ක් සහ තාවකාලික ගොඩනැගිලි 2ක් ඇත; හිමිකම් කියන අය: සීමාසහිත කහවත්ත වැවිලි සමාගම, මාලිගාවත්ත පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 1.6700.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 10.30ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජනවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. ඒ. සී. පී. බමුණුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

12 - 489

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: KHDS/LND/04/ACQ/14.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය.*: 4/3/15/2011/*වීථි/126.*

ගම් පුළුල් කිරීම යටතේ බෙදා දීම සඳහා (මහජන කටයුත්තක්) සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නිල්පත්තුව සුළු කොට්ඨාසයේ, වැල්ලදූර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 12,

අතිරේක අංක 24, පත්‍ර 22 සහ 2014.10.16 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 839, 840, 841, 842 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 2.7698 ඉඩම් කැබැලි.

01. **කැබලි අංක 839**

ඉඩමේ නම: වැල්ලදූරවත්ත ක්ෂේත්‍ර අංක 02; විස්තරය: ගෙවතු සහ වතු, අවු. 5 - 10 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවන්, ස්ථිර ගොඩනැගිලි 3ක් සහ තාවකාලික ගොඩනැගිලි 2ක් ඇත; හිමිකම් කියන අය: සීමාසහිත කහවත්ත වැවිලි සමාගම, මාලිගාවත්ත පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 2.3844.

02. **කැබලි අංක 840**

ඉඩමේ නම: වෙල්ලන්දුර කොටස; විස්තරය: අත්හැර දැමූ කුඹුර; හිමිකම් කියන අය: වන්නොකු ආරච්චිලාගේ හීංමහත්තයා, අංක 26, පලන්සූරිය ගම, කහවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1945.

03. **කැබලි අංක 841**

ඉඩමේ නම: වැල්ලදූරවත්ත ක්ෂේත්‍ර අංක 02; විස්තරය: වත්ත, අවු. 15-20 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: සීමාසහිත කහවත්ත වැවිලි සමාගම, මාලිගාවත්ත පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1205.

04. **කැබලි අංක 842**

ඉඩමේ නම: වැල්ලදූරවත්ත ක්ෂේත්‍ර අංක 02; විස්තරය: වත්ත, අවු. 15-20 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: සීමාසහිත කහවත්ත වැවිලි සමාගම, මාලිගාවත්ත පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0704.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 10.30ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජනවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. ඒ. සී. පී. බමුණුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2015 නොවැම්බර් මස 18 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

12 - 490

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.